# ආක්‍රමණශීලි චර්යා පිළිබඳ සමාජ මනෝවිද්‍යාත්මක විග්‍රහයක්

මුවපැටිගේවෙල හේමාලෝක හිමි

## පසුබිම

යුද ප්‍රචණ්ඩත්වය පිළිබඳව විශ්ව භාරය ("Global Burden of Armed Violence 2011") යන තේමාවෙන් නිකුත් වූ යුද ප්‍රචණ්ඩත්වය හා සංවර්ධනය නම් ජිනීවා ප්‍රකාශන වාර්තාවට අනුව 2004-2009 ත් දක්වා අතර කාලය තුළ ලෝකය පුරා සෑම වසරකම පුද්ගලයන් 396000 ක් බැගින් අන්තර් පුද්ගල ප්‍රචණ්ඩත්වයන්, කණ්ඩායම් ප්‍රචණ්ඩත්වයන් හෝ ආර්ථිකමය වශයෙන් පොළඹවන ලද අපරාධ නිසා චේතනාන්විතව ඝාතනයට ලක් ව තිබේ. වාර්ෂිකව ලෝකය පුරා තවත් මිනිසුන් 55000ක් යුද ගැටුම්, දේශපාලන ප්‍රචණ්ඩත්වයන් හෝ ත්‍රස්තවාදය නිසා මියයති (Krahé 2013). තමාගේම වර්ගයාට එල්ලවන ආක්‍රමණශීලිත්වය හා ප්‍රචණ්ඩත්වය මනෝවිද්‍යාවේ පර්යේෂණයට ලක් වන ප්‍රකට තේමාවකි.

මානව චර්යාව පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා ගැටුම් හා ආක්‍රමණශීලිත්වය පිළිබඳව හැදෑරීම ඉතා වැදගත් වේ. ආක්‍රමණශීලි චර්යාව පිළිබඳව පැතිකඩ රාශියකින් ඉතා පුළුල් ලෙස මනෝවිද්‍යාත්මක අධ්‍යනයන් රාශියක් සිදු වී ඇත. ඒ අතර ආශ පිළිබඳව අභිප්‍රේරණ න්‍යායන්, ඉගෙනුම පිළිබඳව චර්යාවාදී න්‍යායන්, තොරතුරු ක්‍රියාවලිය හා ආරෝපණය පිළිබඳව ප්‍රජානනවාදී ප්‍රවේශ, පරිණාමවාදී න්‍යායන්, ස්වයං නියාමනය පිළිබඳව ආකෘතීන් හා ස්වයං සංසිද්ධිය, ජීවිවිද්‍යාත්මක හා ස්නායු විද්‍යාත්මක අදහස් සුවිශේෂී වේ (Forgas, Kruglanski) Williams et al 2011).

ආක්‍රමණශීලිත්වය හා ගැටුම් පිළිබඳ අධ්‍යයනයන් වර්තමානය වන විට සමාජ මනෝවිද්‍යාවේ මූලික තේමාවන් බවට පත් වී ඇත. එහෙත් ඊට පෙර මෙම සංකල්ප පිළිබඳව අධ්‍යයනය කළේ සමාජ විද්‍යාව හා මානව විද්‍යාව මගිනි. මීට අමතරව දර්ශනය,

සාහිත්‍යය හා ජීවවිද්‍යාව වැනි බොහෝ විෂය ක්ෂේත්‍ර මගින් ආක්‍රමණශීලිත්වය පිළිබඳව විවිධ අධ්‍යයනයන් සිදු කොට තිබේ. එබැවින් ආක්‍රමණශීලිත්වය නිසැක වශයෙන්ම අන්තර් විෂයික වැඩිම අවධානයට ලක් වූ තනි මාතෘකාවක් වශයෙන් සැලකිය හැකිය (Forgas, Kruglanski & Williams et al 2011). ආක්‍රමණශීලි චර්යා පිළිබඳව සමාජ මනෝවිද්‍යාත්මක ප්‍රවේශය ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණය අරමුණයි. විශේෂයෙන්ම මෙහිදී සමාජ මනෝවිද්‍යාව තුළ ආක්‍රමණශීලිත්වය නිර්වචනය කොට ඇති ආකාරය, එහි විවිධ පැතිකඩ හා එය වර්ධනය වීම සඳහා බලපානු ලබන හේතු පිළිබඳව විමර්ශනය කෙරේ.

**ආක්‍රමණශීලිත්වය යනු කුමක් ද?**

ආක්‍රමණශීලිත්වය යනු හිතාමතාම වෙනත් අයෙකුට හානි පැමිණවීම හෝ ඔවුන් අකමැති දෙයක් සිදු කිරීම හා සම්බන්ධ වූ සමාජ අන්තර් ක්‍රියාකාරිත්වයකි. මෙය ප්‍රකට හෝ අප්‍රකට (විවෘතව හා සැඟවුණු) ආකාරයෙන් ඉදිරිපත් විය හැකිය. ආක්‍රමණශීලිත්වය නිවැරදිව නිර්වචනය කිරීම පිළිබඳව පර්යේෂකයන් අතර යම් යම් මතභේදාත්මක අදහස් පවතී. කායිකව තෙරපීම, තල්ලු කිරීම හෝ පහර දීම ආක්‍රමණශීලිත්වය ලෙස නිර්වචනය කළ හැකිය. තර්ජනාත්මකව කතා කිරීම, වාචික හිංසනය හා තර්ජනාත්මක මුහුණු ප්‍රකාශන ද මේ යටතට ඇතුළත් වේ. යමෙකු ප්‍රතික්ෂේප කිරීම හෝ කතා නොකර සිටීම ද (බ්‍රහ්මදණ්ඩනය) ආක්‍රමණශීලිත්වයේ ලක්ෂණයකි (Hogg & Vaughan 2018). ඇමරිකානු මනෝවිද්‍යාඥයන්ගේ සංගමයේ ශබ්දකෝශයට අනුව ආක්‍රමණශීලිත්වය යනු අන්‍යයන්ට කායිකව හෝ මානසිකව හානි පැමිණවීමේ අරමුණෙන් ඉදිරිපත් වන චර්යාවකි. එය සාමාන්‍ය කෝපයෙන් වෙන්කොට දැක්විය හැකි තත්වයකි. කෝපයේ දී සිදු වන්නේ කිසියම් ඉලක්කයක් සපුරා ගැනීමට ක්‍රියා කිරීමක් වන අතර එහි අනිවාර්ය හානි පැමිණවීමේ හෝ විනාශ කිරීමේ අරමුණක් නොමැත (APA Dictionary of Psychology 2015).

ආක්‍රමණශීලි චර්යාවක් කායිකව, වාචසිකව, මානසිකව හෝ චිත්තවේගික යන ඕනෑම අංශයකින් ඉදිරිපත් විය හැකිය. එසේම ඒවා විවිධ අවස්ථාවන් තුළ නොයෙකුත් අරමුණු මුල්කරගෙන පැනනැඟිය

හැකිය. ආක්‍රමණශීලිත්වය පැනනඟින එබඳු පොදු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

කෝපය හෝ විරෝධය ප්‍රකාශ කිරීම සඳහා

ආධිපත්‍යය පැතිරවීමට

තැති ගැන්වීමට හෝ තර්ජනය කිරීමට

කිසියම් ඉලක්කයක් ජයගැනීමට

අයිතිය ප්‍රකාශ කිරීම සඳහා

බියට ප්‍රතිචාර දැක්වීමක් ලෙස

වේදනාවට ප්‍රතික්‍රියාවක් වශයෙන්

අන්‍යයන් සමග තරග කිරීමේ දී

ආක්‍රමණශීලිත්වය පිළිබඳව සමාජ මනෝවිද්‍යාඥයන් විසින් ඉදිරිපත් කොට ඇති විවිධ නිර්වචන

පුද්ගලයෙකුට තුවාල සිදුවන හෝ දේපල විනාශ වන චර්යාවකි. - ඇල්බර්ට් බන්ඩුරා (Albert Bandura) විසින් ඉදිරිපත් කරන ලදි.

සමාන ජාතියේම (එකම සත්ව වර්ගයේ) වෙනත් අයෙකුට හානි කිරීමේ අදහස ඇති චර්යාවකි

හානි කිරීම හෝ තුවාල කිරීම කෙරෙහි අකමැති යම්කිසි වෙනත් ජීවියෙකුට හානි කිරීමේ හෝ තුවාල කිරීමේ අරමුණින් එල්ලවන චර්යාවකි

චේතනාන්විතව වෙනත් අයෙකුට හිරිහැර කිරීම හෝ හානි කිරීම

වෙනත් අයෙකුට වහා හානි කිරීමේ අරමුණින් ඔහු වෙත එල්ලවෙන චර්යාව (Hogg & Vaughan 2018)

## ආක්‍රමණශීලි චර්යාවේ වර්ග

ආක්‍රමණශීලිත්වය මුලිකවම කායික ආක්‍රමණශීලිත්වය හා සමාජ ආක්‍රමණශීලිත්වය යනුවෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. කායික ආක්‍රමණශීලිත්වය යනු පුද්ගලයෙකුගේ ශරීරයට හානි කිරීමයි. සමාජ ආක්‍රමණශීලිත්වය යනු දාමරිකකම් කිරීම, සයිබර් අවකාශයේ බුලී කිරීම, අපහාස කිරීම, හානිකර කටකථා පැතිරවීම හා සමාජයෙන් කොන් කිරීම ආදියයි (Dehue et el 2008). මීට අමතරව සමාජ මනෝවිද්‍යාඥයන් විසින් ආක්‍රමණශීලිත්වය එදිරිවාදී, උපකරණමය හා ආවේදන ආක්‍රමණශීලිත්වය යනුවෙන් ද වෙන් කොට දක්වා තිබේ.

## එදිරිවාදී ආක්‍රමණශීලිත්වය (Hostile Aggression)

එදිරිවාදී ආක්‍රමණශීලිත්වය යනු කෝපය හා එදිරිවාදිත්වය නමැති චිත්තවේගික තත්වයන් නිසා ඇතිවන ආක්‍රමණශීලිත්වය යි. මෙහි මුඛ්‍ය අරමුණ වන්නේ වෙනත් අයෙකුට කායිකව හෝ මානසිකව හානි පැමිණ වීමයි. (Gilovich et el 2018) යම්කිසි සිදුවීමක් මුල් කරගෙන කෙනෙකුට කෝපයෙන් පහර දීම (උදාඃ තමාගේ යමක් සොරකම් කරන ලද අවස්ථාවක්) එදිරිවාදිත්වය ප්‍රකට වන අවස්ථාවකි. බොහෝ මනුෂ්‍ය ඝාතකයන්ට එදිරිවාදී ආක්‍රමණශීලිත්වයක් ඇත.

## උපකරණමය ආක්‍රමණශීලිත්වය (Instrumental Aggression)

ඇතැම් අවස්ථාවල පුද්ගලයා සමාජ තත්ත්වයක් ලබා ගැනීමට, අන්‍යයන්ගේ අවධානය දිනා ගැනීමට, ධනය ලබාගැනීමට, දේශපාලන හා මතවාදමය හේතුන් සංවර්ධනය කරගැනීමට අන්‍යයන්ට හානි සිදු කරයි. එවැනි අවස්ථාවලදී ආක්‍රමණශීලිත්වය උපකරණයක් ලෙස භාවිත වේ (Gilovich et el 2018). උපකරණමය ආක්‍රමණශීලිත්වය තුළ අන්‍යයන්ට හානි කිරීමේ අරමුණ තිබුණ ද එය මූලිකවම ඉදිරිපත් වන්නේ කිසියම් වෙනත් අරමුණක් මුල් කොටගෙන ය. බොහෝ යුද ගැටුම් තුළ උපකරණමය ආක්‍රමණශීලිත්වය ඇත. 2003 වර්ෂයේ දී ඇමරිකානු හා බ්‍රිතාන්‍ය නායකයන් ඉරාකයට පහර දුන්නේ ඉරාක ජාතිකයන් ඝාතනය කිරීමේ එදිරිවාදිත්වයකින් නොව ඉරාකයේ තිබූ සමූලඝාතක අවි විනාශ කිරීමේ අරමුණෙන් යැයි සාධාරණීකරණය

කිරීම උපකරණමය ආක්‍රමණශීලීත්වය සඳහා උදාහරණයකි (Myers & Twenge 2013).

**ආවේදන ආක්‍රමණශීලීත්වය (Affective Aggression)**

කිසියම් අපහසුතාවක් ඇති කරනු ලබන දෙයක් පිළිබඳව ඇතිවන චිත්තවේගික ප්‍රතිචාරය සමඟ සම්බන්ධ වූ ආක්‍රමණශීලී තත්වයකි. කෙසේ නමුත් මෙහිදී අපහසුතාව ඇති කරන දෙය කෙරෙහි සෘජුවම ආක්‍රමණශීලීත්වය මුදා හැරීමක් සිදු නොවන අතර වෙනත් පුද්ගලයෙකු හෝ වස්තුවක් හරහා විස්ථාපනය කළ හැකිය (APA Dictionary of Psychology 2015).

උදා: ආයතන ප්‍රධානියා කෙරෙහි පවතින ආක්‍රමණශීලී හැඟීම් බිරිඳ හෝ දරුවන් හරහා මුදා හැරීම

**ආක්‍රමණශීලීත්වය පිළිබඳව ඉදිරිපත් ව ඇති න්‍යායන්**

ආක්‍රමණශීලීත්වය සහජයෙන් පැමිණියක් ද නැතහොත් පුහුණු කරන ලද්දක් ද යන්න බොහෝ කලක සිටම දාර්ශනිකයන් අතර සංවාදයට ලක් වූ තේමාවකි. එම සංවාදය (Nature-Nurture Controversy-සහජ-පුහුණු මතභේදය) නමින් ප්‍රසිද්ධියට පත්ව තිබුණි (Hogg and Vaughan 2018). ඒ අනුව මෙබඳු සංවාද පදනම්කරගෙන ආක්‍රමණශීලීත්වය යනු කුමක්දැයි පැහැදිලි කිරීම සඳහා විවිධ න්‍යායන් හා සංකල්ප රාශියක් ඉදිරිපත් ව ඇත. ආශමය චර්යා හා පරිණාමවාදී සංකල්ප, ජීවවිද්‍යාත්මක සාධකවල බලපෑම, ජීවරසායනික සංයුතීන්ගේ බලපෑම, සමාජ ඉගෙනුම් න්‍යාය, ඉච්ඡාභංගත්වය පිළිබඳව න්‍යාය, පුද්ගලබද්ධ සාධකවල බලපෑම හා ආක්‍රමණශීලීත්වය ඇතිකරන ඉඟි ඒ අතර කැපී පෙනෙන ඒවා වෙති.

**ආශමය චර්යා හා පරිණාමවාදී සංකල්ප**

ආක්‍රමණශීලීත්වය පිළිබඳව වඩා ප්‍රකටම හා පැරණිතම විග්‍රහය වන්නේ මෙයයි. සිග්මන් ෆ්‍රොයිඩ් මේ සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. ෆ්‍රොයිඩ්ට අනුව ආක්‍රමණශීලීත්වය මරණ ආශය Death Instinct) මුල් කොට ගෙන පැන නගියි. මෙහි

ප්‍රතිවිරුද්ධ අංශය වන්නේ ජීවන (Life Instinct) ආශයයි. මරණ ආශය මගින් පුද්ගලයා මූලිකවම ස්වයං ඝාතනය සඳහා මෙහෙයවයි. නමුත් පසුව එය අන්‍යයන් ඝාතනයත් දක්වා වර්ධනය වේ (Baron and Branscombe 2017). පසුව ෆ්‍රොයිඩ්ගේ අනුගාමිකයන් විසින් මෙම අදහස වඩාත් සංස්කරණාත්මකව ඉදිරිපත් කරන ලදී. පශ්චාත් ෆ්‍රොයිඩියානුවන්ට අනුව ආක්‍රමණශීලිත්වය වඩාත් තාර්කික වේ. එහෙත් සෑම ජීවියෙකු තුළම මූලිකවම දැකගත හැකි සෞඛ්‍ය සම්පන්න ප්‍රාථමික ආරක්ෂණ ආශමය ක්‍රියාවලියකි (Hogg & Vaughan 2018). මීට සමාන අදහසක් සත්ත්ව විද්‍යාඥයෙකු වූ කොන්රැඩ් ලෝරන්ස් (Konrad Lorence) විසින් ද ඉදිරිපත් කරන ලදී. ඔහු පෙන්වා දෙන ආකාරයට ආක්‍රමණශීලිත්වය ප්‍රධාන වශයෙන්ම පැන නගින්නේ සහජ පහර දීමේ ආශයක් වශයෙනි. එමගින් ශක්තිමත් පිරිමි සත්ත්වයා සහකාරියක් ලබාගන්නා අතර ඔවුන්ගේ ජාන පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරයි. කෙසේ නමුත් මෙම අදහස් බොහෝමයක් සමාජ මනෝවිද්‍යාඥයන් විසින් ප්‍රතික්ෂේප කොට ඇත. ඔවුන් තර්ක කරන්නේ මෙවැනි සංකීර්ණ චර්යා පද්ධතියක් ජානමය සාධක මත තීරණය වන්නේ කෙසේ ද යන්නයි (Baron and Branscombe 2017) කෙසේ වුවද ආක්‍රමණශීලිත්වයේ විද්‍යාත්මක පැතිකඩ පූර්ණ වශයෙන්ම ප්‍රතික්ෂේප කළ නොහැකිය. මන්ද ප්‍රචණ්ඩත්වය අපගේ ශාරීරික ක්‍රියාවලියේ ප්‍රතික්‍රියාවක් වන බැවිනි.

**ස්නායුක බලපෑම**

මොළය පිළිබඳව පර්යේෂකයන් සඳහන් කරන අන්දමට මොළයේ ස්නායු පද්ධතිය සතුන්ගේ හා මිනිසුන්ගේ ආක්‍රමණශීලි චර්යා සඳහා බලපායි. විද්‍යාඥයන් විසින් කෘතිම උපකරණ මගින් මොළයේ අදාළ ප්‍රදේශ උත්තේජනය කිරීමෙන් ආක්‍රමණශීලිත්වය වැඩිවන බවත් එම ප්‍රදේශවල ක්‍රියාකාරිත්වය අඩපණ කළ පසු ආක්‍රමණශීලිත්වය අඩුවන බවත් නිරීක්ෂණය කොට තිබේ. එක් කාන්තාවකගේ මොළයේ ඇමිග්ඩලා කොටස වේදනා රහිත විද්‍යුත් ධාරාවක් මගින් උත්තේජනය කළ විට ඇය කෝපයට පත් වී තම ගිටාරය සුණු විසුණු වී යන සේ බිත්තියේ ගසා ඇත. මෙයින් අනාවරණය වන්නේ ප්‍රචණ්ඩකාරී පුද්ගලයාගේ මොළය කිසියම් ආකාරයකින් අසාමාන්‍ය ආකාරයට ක්‍රියා කරන බවයි (Moyer 1983).

**ආරයේ (ජානමය) බලපෑම**

පුද්ගලයාගේ ජානමය සාධක ඔහුගේ ස්නායු පද්ධතියේ ආක්‍රමණශීලි සංවේදීතාව සඳහා බලපායි. සතුන් ආක්‍රමණශීලි ලක්ෂණ ඇතිවන ලෙස අභිජනනය කළ හැකි බව ඉතා ප්‍රකට කරුණකි. ඇතැම් විට එය ප්‍රායෝගික අවශ්‍යතා සඳහා මෙන්ම පර්යේෂණ අරමුණු සඳහා ද සිදු කරයි. ෆින්ලන්ත මනෝවෛද්‍යවරියක වූ කර්ස්ටි ලැගර්ස්පෙට්ස් (Kirsti Lagerspetz) විසින් සාමාන්‍ය මීයන් වඩාත් ආක්‍රමණශීලි මීයන් ලෙස අභිජනනය කරන ලදී. එසේම ඇය ආක්‍රමණශීලිත්වය අඩු මීයන් පරම්පරාවක් ද අභිජනනය කර ඇත. ඒ අනුව ඇය විසින් වඩාත් ආක්‍රමණශීලි හා වඩාත් තැන්පත් මීයන් පරම්පරා දෙකක් බිහි කරන ලදී (Myers & Twenge 2013).

**ජීව රසායනික සංයුතීන්ගේ බලපෑම**

**ඇල්කොහොල්**

රසායනාගාර පර්යේෂණ හා පොලිස් වාර්තා මඟින් ඇල්කොහොල් රසායනය ආක්‍රමණශීලි චර්යා සඳහා විශාල වශයෙන් බලපාන බව සොයාගෙන තිබේ (Myers & Twenge 2013). මැක්ගිල් (McGill) විශ්වවිද්‍යාලයේ මනෝවිද්‍යාව හා මනෝවෛද්‍ය විද්‍යාව පිළිබඳව මහාචාර්යවරයෙකු වන රොබට් ඕ. පිල් (Robert O.Pihl) ප්‍රකාශ කරන ආකාරයට මනුෂ්‍ය ඝාතන, ස්ත්‍රී දූෂණ හා පහරදීම් හරිඅඩක්ම ඇල්කොහොල් සමග සම්බන්ධ වේ. ඇල්කොහොල් මගින් මධ්‍ය ස්නායු පද්ධතියේ ක්‍රියාකාරිත්වය අඩපණ කොට මන්දගාමී කරයි. විශ්වවිද්‍යාල සිසුන්ගේ විද්‍යුත් දිනපොත් භාවිත රටාව ආශ්‍රයෙන් සිදුකරන ලද පර්යේෂණයක් මගින් පෙන්වා දී ඇත්තේ ඇල්කොහොල් භාවිත කරන ලද සහකරුවා තම සහකාරිය කෙරෙහි ආක්‍රමණශීලිත්වයෙන් කටයුතු කිරීමේ වැඩි නැඹුරුවක් පවතින බවයි (Moore & Swift 2011).

**කංසා හා හෙරෝයින්**

කෙසේනමුත් ඇතැම් පර්යේෂකයන් තර්ක කරන ආකාරයට කංසා මත්ද්‍රව්‍යයේ බලපෑම ආක්‍රමණශීලිත්වය සඳහා මීට වඩා වෙනස්

අයුරින් සිදුවේ. ඒ අනුව මිනිසාගේ කායික ආක්‍රමණශීලිත්වය සඳහා කංසා භාවිතයේ බලපෑම පිළිබඳව සිදුකරන ලද පර්යේෂණයක් මගින් අනාවරණය කොට ගෙන තිබෙන්නේ ඉතා සුළු මට්ටමෙන් කංසා භාවිත කළ පුද්ගලයන්ට වඩා මධ්‍යස්ථ හා තීව්‍ර මට්ටමෙන් කංසා භාවිත කළ පුද්ගලයන් තුළ ආක්‍රමණශීලිත්වය සාපේක්ෂ ලෙස අඩුවී ඇති බවයි (Myerscough and Taylor 1985). කෙසේ වුව ද ආක්‍රමණශීලි හැසිරීම් සඳහා හෙරෝයින්වල බලපෑම පිළිබඳ සිදු කරන ලද අධ්‍යයනයකට අනුව හෙරෝයින් භාවිත කරන ලද පුරුෂයන්ගේ ආවේගශීලිත්වය හා ආක්‍රමණශීලිත්වය හෙරොයින් භාවිත නොකරන පුද්ගලයන්ගේ ආක්‍රමණශීලිත්වය හා ආවේගශීත්වයට වඩා වැඩි වී ඇත (Cicek, et al 2017).

**ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනයේ බලපෑම**

ආක්‍රමණශීලිත්වය හා පුරුෂයන්ගේ ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය අතර සම්බන්ධයක් තිබෙන බව පර්යේෂණ මගින් සොයාගෙන තිබේ. එක් පර්යේෂණයකට අනුව ගිනි අවියක් හැසිරවීමෙන් අනතුරුව පුරුෂයන්ගේ ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය ඉහල ගොස් ඇත. එවිට ඔවුන් අන්‍යයන් කෙරෙහි වඩාත් ආක්‍රමණශීලි ලෙස ක්‍රියා කොට ඇත (Klinesmith, Kasser & McAndrew 2006). සාමාන්‍ය වයස් සීමාවල පසුවන දරුවන් හා වැඩිහිටියන් අතර ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය වැඩි අයවලුන් සමාජ විරෝධී චර්යාවන්, මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම් හා ආක්‍රමණශීලි චර්යාවන්ට නැඹුරු වීමේ වැඩි ඉඩකඩක් තිබේ (Archer 1991).

**දුර්වල පෝෂණය**

පෝෂණ ගුණයෙන් අඩු ආහාර ලබා ගැනීම ආක්‍රමණශීලි චර්යා සඳහා බලපාන තවත් සාධකයකි. පාසල් ළමුන් යොදාගෙන සිදුකරන ලද පර්යේෂණයකට අනුව පෝෂණ ගුණයෙන් අඩු සෝඩා සතියකට පස් වතාවකට වඩා වැඩියෙන් භාවිත කරන ලද ළමුන් තම සගයන් හා සොහොයුරන්, පෙම්වතා හෝ පෙම්වතිය කෙරෙහි වඩාත් ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කොට ඇත . එසේම ඔවුන් ගිනි අවියක් හෝ පිහියක් වැනි ආයුධයක් රැගෙන යෑමේ වැඩි නැඹුරුතාවක් ද පෙන්වා තිබේ (Solnick & Hemenway 2012).

## ජීවිවිද්‍යාත්මක හා චර්යාත්මක සාධකවල අන්තර් ක්‍රියාකාරිත්වය

ඉතා ඉහළ ටෙස්ටොස්ටෙරෝන් මට්ටම ආධිපත්‍ය හිමිකර ගැනීමේ චර්යා හා ආක්‍රමණශීලි චර්යා සඳහා බලපායි. අනෙක් අතට ආක්‍රමණශීලි චර්යා මගින් ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය ඉහළ යයි (Mazur & Booth 1998). ඒ අනුව එම දෙක අතර අන්තර් ක්‍රියාකාරිත්වයක් පවතින බව පෙනී යයි. 2008 වර්ෂයේ ඇමරිකානු මැතිවරණයෙන් ජයග්‍රහණය කළ බැරක් ඔබාමාට ඡන්දය ප්‍රකාශ කළ ඡන්දදායකයන්ගේ ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය ඉහල ගොස් ඇති අතර ප්‍රතිවාදියාට ඡන්දය ප්‍රකාශ කොට පරාජය වූවන්ගේ එම හෝමෝනය අඩු වී ඇත (Stanto 2009).

## ඉච්ඡාභංගත්වය හා ආක්‍රමණශීලිත්වය

“ඉච්ඡාභංගත්වය-ආක්‍රමණශීලිත්වය පිළිබඳව උපන්‍යාසය” (Frustration-Aggression Hypothesis) මනෝවිද්‍යාවේ ආක්‍රමණශීලිත්වය පිළිබඳව මුල්ම න්‍යායන්ගෙන් එකකි. මානව විද්‍යාඥයෙකු වූ ජෝන් ඩොලර්ඩ් (John Dollard) හා ඔහුගේ සහායක මනෝවිද්‍යාඥයන් විසින් පෙන්වා දෙන ලද ආකාරයට ආක්‍රමණශීලිත්වය සෑමවිටම කිසියම් අපේක්ෂා භංගත්වයකට පත් කරන ලද සිදුවීමක් හෝ අවස්ථාවක් නිසා ඇති වේ. ඉච්ඡාභංගත්වය යනු කිසියම් ඉලක්කයක් ඉටු කර ගැනීමට පුද්ගලයාට බාධා පමුණුවන ඕනෑම දෙයකි (Dollard 1939). උදාහරණයක් ලෙස කිසියම් අවස්ථාවක දී ඔබ ඒ.ටී.එම් (ATM) යන්ත්‍රයෙන් මුදල් ලබාගැනීම සඳහා කාඩ්පත ඇතුළත් කර රහස්‍ය අංක යොදා මුදල් ලබා ගැනීමට උත්සාහ කළ ද එම යන්ත්‍රයේ කිසියම් දෝෂ සහගත තත්ත්වයක් නිසා ඔබට මුදල් ලබාගැනීමට නොහැකි වුවහොත් ඔබ ඉච්ඡාභංගත්වයට පත් වේ. එහිදී ඔබගේ ඉලක්කය වන්නේ මුදල් ලබාගැනීමයි. එම ඉලක්කය සපුරා ගැනීමට බාධා පමුණුවන්නේ හොඳින් ක්‍රියා නොකරන ATM යන්ත්‍රය යි. කිසියම් ඉලක්කයක් ජය ගැනීමට පුද්ගලයාගේ අභිප්‍රේරණය ඉතා බලවත් වීමේ දී, ඉතා ඉහළ තෘප්තියක් බලාපොරොත්තු වීමේ දී හා අවහිරවීම සම්පූර්ණ වීමේ දී ඉච්ඡාභංගත්වය වර්ධනය වේ (Myers & Twenge 2013). ඇතැම්විට පුද්ගලයා ආක්‍රමණශීලිත්වය ඉච්ඡාභංගත්වය ඇති කරන ලද පුද්ගලයා/දෙය කෙරෙහි සෘජුවම

මුදා නොහරියි. බොහෝ පුද්ගලයන් සෘජු ප්‍රතිචාර දැක්වීම යටපත් කොටගෙන ආක්‍රමණශීලිත්වය විස්ථාපනය කරයි. එනම් එය වඩාත් ආරක්ෂිත ක්‍රමවේදයක් හරහා මුදා හැරීමට යොමු වේ. මෙම න්‍යාය මිශ්‍ර ප්‍රතිඵල ඇති කළ නිසා පසු කලෙක ලෙනාඩ් බර්කෝවිට්ස් (Leonard Berkowitz) විසින් සංශෝධනය කරන ලදි (Myers & Twenge 2013).

ඔහු පවසන්නේ මුල් න්‍යාය මගින් ඉච්ඡාභංගත්වය හා ආක්‍රමණශීලිත්වය අතර සම්බන්ධතාව අධික ලෙස උළුප්පා දක්වා ඇති බවයි. ඒ අනුව ඔහුගේ සංශෝධිත න්‍යායට අනුව ඉච්ඡාභංගත්වය නිසා ආක්‍රමණශීලිත්වය ඇති වන්නේ පුද්ගලයා නොසතුටු වූ විටදී පමණි (Averill 1983). බොහෝ පුද්ගලයන් ක්‍රීඩා කිරීමේදී ඉච්ඡාභංගත්වයට පත් වේ. එහෙත් ඔවුහු සාමාන්‍යයෙන් ප්‍රතිවිරුද්ධ කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් හිතාමතාම සිදු කරනු ලබන අසාධාරණ ක්‍රියාකාරකමක දී හැරෙන්නට ආක්‍රමණශීලි නොවෙති.

**ආක්‍රමණශීලිත්වය හා ඉගෙනුම් න්‍යාය**

ඉහත සඳහන් කරන ලද න්‍යායන් දෙකෙන්ම අවධාරණය කරන්නේ ආක්‍රමණශීලිත්වය අභ්‍යන්තර සාධක හේතුවෙන් හෝ බාහිර සාධකවල බලපෑමෙන් පැනනගින බවයි. එහෙත් ඉගෙනුම් න්‍යායට අනුව ආක්‍රමණශීලිත්වය අප විසින් උගත් චර්යාවකි.

**ත්‍යාග ලබාදීම හා ආක්‍රමණශීලිත්වය**

ආක්‍රමණශීලි චර්යාවකට ලැබෙන ත්‍යාග මගින් (සතුටුදායක ප්‍රතිඵලය) එම චර්යාව නැවත නැවත සිදු වී ඉගෙනුමක් බවට පත් වේ. ත්‍යාග ලබාදීම (දිරිගැන්වීම) මගින් ආක්‍රමණශීලිත්වය වර්ධනය වන බව දේශපාලනය, ව්‍යාපාර හා ක්‍රීඩා වැනි බොහෝ ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කිරීමේ දී පෙනී යයි. ඡන්දයකින් ජයග්‍රහණය කිරීමේ අවස්ථාව, කොන්ත්‍රාත්තුවක් ලබා ගැනීමේ අවස්ථාව හෝ ක්‍රීඩාවකදී විරුද්ධ පාක්ෂිකයා පරාජය කිරීමේ අවස්ථාව තරගකරුවාට හිංසා කිරීම මගින් වර්ධනය වන බව බොහෝ දෙනා විශ්වාස කරති. රූපවාහිනී නැරඹීම මගින් ප්‍රචණ්ඩත්වය ඉගෙන ගන්නා ආකාරය පිළිබඳව සිදු කරන ලද පර්යේෂණවලට අනුව ආක්‍රමණශීලි චර්යා

සඳහා ත්‍යාග ලැබුණු චරිතවල දර්ශන නැරඹූ පුද්ගලයන් තුළ එවැනි දර්ශන නොරඹන ලද පුද්ගලයන්ට වඩා ආක්‍රමණශීලි ලක්ෂණ වර්ධනය වී ඇත (Encyclopedia of Psychology 2000). ආක්‍රමණශීලි වීම මගින් අනෙක් ළමුන් සාර්ථක ලෙස තැති ගන්වන ලද ළමයා තව තවත් ආක්‍රමණශීලි වීමේ වැඩි ඉඩකඩක් තිබෙන බව සොයාගෙන තිබේ (Patterson 1967).

බොහෝ ත්‍රස්තවාදී ප්‍රහාර මේ හා සමාන ය. එහිදී බලය අඩු පුද්ගලයන් විසින් අවධානය ලබා ගැනීම සඳහා එවැනි ක්‍රියා සිදු කරනු ලබති. විශේෂයෙන්ම මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරවල අරමුණ වන්නේ තැති ගැන්වීම හා අවධානය යොමු කරවා ගැනීමයි. ඉපැරණි චීන ආප්තෝපදේශයකට අනුව ත්‍රස්තවාදීන්ගේ ආදර්ශ පාඨය වන්නේ "එක් අයෙකු මරන්න දහසක් බියට පත් කරන්න" (Myers & Twenge 2013, p.306 ) යන්නයි. මෙහිදී මොවුන් බෝම්බ ප්‍රහාර තැතිගැන්වීමේ උපකරණයක් ලෙස යොදාගෙන ඇත.

**නිරීක්ෂණාත්මක ඉගෙනුම හා ආක්‍රමණශීලිත්වය**

ඇල්බට් බන්ඩූරා විසින් හඳුන්වා දෙන ලද සමාජ ඉගෙනුම් න්‍යාය ආක්‍රමණශීලිත්වය සමාජ පරිසරයෙන් (පවුල, පරිසරය, උප සංස්කෘතිය හා ජනමාධ්‍ය) ඉගෙන ගන්නා ආකාරය පැහැදිලි කර ගැනීම සඳහා ආධාර වන වැදගත් ප්‍රවේශයක් වශයෙන් සැලකිය හැකිය. මිනිසා ආක්‍රමණශීලි ප්‍රතිචාරයන් සමූහයක් සමග උපත ලබා නොමැත. මිනිසාගේ ආක්‍රමණශීලි හැසිරීම් ද ඔහුගේ අනෙකුත් සංකීර්ණ සමාජ හැසිරීම් මෙන්ම සෘජු අත්දැකීමක් මගින් හෝ අනෙකාගේ හැසිරීම් රටාවක් නිරීක්ෂණය කිරීමෙන් ඉගෙන ගත යුතුය (නිදඃ සමාජ ආකෘතීන්- රූපවාහිනියේ චිත්‍රපටයක හෝ වීඩියෝ ක්‍රීඩාවල ආක්‍රමණශීලි හැසිරීම් සහිත පුද්ගලයන් හෝ චරිත) (Baron & Branscombe 2017). බන්ඩූරාගේ සුප්‍රකට ,Bobo Doll, සම්පරීක්ෂණය මගින් ළමුන් ආක්‍රමණශීලිත්වය සමාජ පරිසරයෙන් ඉගෙන ගන්නා ආකාරය පෙන්වා දී ඇත. (Myers & Twenge 2013). බන්ඩූරා ට අනුව කිසියම් සුවිශේෂී අවස්ථාවක පුද්ගලයා ආක්‍රමණශීලි වනවාද නැද්ද යන්න සාධක කිහිපයක් මත රඳා පවතී.

පුද්ගලයෙකුට අනෙකුත් පුද්ගලයන්ගේ පූර්ව ආක්‍රමණශීලි හැසිරීම් පිළිබඳව ඇති අත්දැකීම්

ආක්‍රමණශීලි හැසිරීම්වල අතීත සාර්ථකත්වය

වර්තමානයේ දී ආක්‍රමණශීලි පුද්ගලයෙකුට ත්‍යාග හෝ දඬුවම් ලැබීමට ඇති නැඹුරුතාව

අදාළ අවස්ථාව තුළ සංකීර්ණ සමාජ හා පාරිසරික සාධක සමූහය (Hogg & Vaughan 2018)

**ආක්‍රමණශීලිත්වය සඳහා පුද්ගලබද්ධ සාධකවල බලපෑම**

පුද්ගලයාට එදිනෙදා සමාජ ජීවිතයේ දී මුණගැසෙන සෑම පුද්ගලයෙක් ම එක හා සමානව ආක්‍රණශීලි චර්යා ප්‍රකට නො කරති. ඇතැමෙක් වඩාත් ආක්‍රමණශීලි වන අතර තවකෙක් වඩාත් සන්සුන් වෙති. සමස්තයක් ලෙස ගතහොත් අපට හමුවන බොහෝ පිරිස් මධ්‍යස්ථ ආක්‍රමණශීලි ලක්ෂණ පෙන්නුම් කරති. වඩාත් සන්සුන් හා වඩාත් ආක්‍රමණශීලි ලක්ෂණ ප්‍රකට කරන පුද්ගලයන් සාපේක්ෂව සමාජයේ ප්‍රමාණයෙන් අඩුය. බොහෝ විට සිටින්නේ ඉහත කී පරිදි මධ්‍යස්ථ ලක්ෂණ පෙන්නුම් කරන පුද්ගලයන් ය.

මෙමගින් පැහැදිලි වන්නේ ආක්‍රමණශීලි චර්යා පුද්ගලබද්ධ සාධක සමඟ යම් සම්බන්ධතාවක් පවතින බවයි. ඒ අනුව ආක්‍රමණශීලි චර්යා සඳහා පුද්ගලබද්ධ සාධක බලපාන්නේ නම් ඒවා කවර සාධක ද යන්න පිළිබඳව විමසා බැලීම වැදගත් වේ.

**එදිරිවාදිත්වය පිළිබඳ අගතීන් (Hostile Bias)**

ළමුන් හා වැඩිහිටියන් තුළ එදිරිවාදිත්වය පිළිබඳ අගතීන් තිබෙන බව හඳුනාගෙන තිබේ. ඇතැම් පුද්ගලයෝ සාමාන්‍ය සමාජීය චර්යා වඩාත් ආක්‍රමණශීලි චර්යා ලෙස සංජානනය කිරීමට වැඩි නැඹුරුතාවක් දක්වති. එය එදිරිවාදී සංජානන අගතිය (Hostile Perception Bias) යනුවෙන් හැඳින් වේ. ආක්‍රමණශීලිත්වය වෙත නැඹුරු වූ ඇතැම් පුද්ගලයන් අන්‍යයන්ගෙන් නිරන්තරයෙන්ම ආක්‍රමණශීලිත්වය අපේක්ෂා කරන අතර ආක්‍රමණශීලිත්වය

පිළිබඳව පුරෝකථනයන් ද සිදු කරයි. මෙම ප්‍රවණතාව එදිරිවාදී අපේක්ෂණ අගතිය (Hostile Expectation Bias) යනුවෙන් හැඳින් වේ (Encyclopedia of Psychology 2000). පුද්ගලයා වෙනත් පුද්ගලයෙකු ආක්‍රමණශීලි අයෙකු ලෙස සංජානනය කළහොත් ඔහු කෙරෙහි නිරන්තරයෙන් ම ආක්‍රමණශීලිත්වය මුදාහැරීමට පෙළඹේ. පර්යේෂකයන්ට අනුව මීට හේතුව පුද්ගලයා ආක්‍රමණශීලිත්වය පිළිබඳව සිතන ආකාරය යි. මෙහිදී පුද්ගලයා බොහෝ සෙයින් අනෙකා කෙරෙහි ආක්‍රමණශීලි ලක්ෂණ ආරෝපණය කිරීමට යොමු වේ. මෙය ආක්‍රමණශීලි චරිත ලක්ෂණ අගතිය (Hostile Attributional Bias) ලෙස හැඳින් වේ. මෙවැනි අගතීන් දැඩිලෙස තිබෙන පුද්ගලයන් අනෙකුත් පුද්ගලයන්ගේ හිංසාකාරී නොවන චර්යා පවා ආක්‍රමණශීලි චර්යා ලෙස සලකයි (Baron & Branscombe 20179).

**ආකල්ප හා විශ්වාස (Attitude and Belief)**

ආක්‍රමණශීලිත්වය සඳහා නැඹුරුතාවක් දක්වන පුද්ගලයෝ බොහෝවිට ආක්‍රමණශීලිත්වය පිළිබඳව ධනාත්මක ආකල්ප දරති. ඔවුහු කිසියම් ගැටලුකාරී අවස්ථාවකදී ආක්‍රමණශීලිත්වය වඩාත් ප්‍රතිඵලදායක හා ගැළපෙන විසඳුමක් ලෙස සලකති. ආක්‍රමණශීලි සිතිවිලි හා විසඳුම් ඔවුන්ගේ මනසට වේගයෙන් හා පහසුවෙන් පැමිණේ. විශේෂයෙන්ම ආක්‍රමණශීලි පුද්ගලයන්ට සාමකාමී විකල්පයකට යොමු වීම දුෂ්කර වේ (Encyclopedia of Psychology 2000).

**"ඒ" වර්ගයේ පෞරුෂ ලක්ෂණ ඇති පුද්ගලයන් (Type A Personality)**

පර්යේෂකයන් විසින් 'ඒ' වර්ගය නමින් චර්යා ලක්ෂණ රටාවක් හඳුනාගෙන තිබේ (Matthews 1982). 'ඒ' වර්ගයේ චරිත ලක්ෂණ ඇති පුද්ගලයන් අන්‍යයන් සමඟ ගනුදෙනු කිරීමේදී අධික්‍රියාකාරී හා අධිතරගකාරී හැසිරීම් රටාවක් පෙන්නුම් කරයි. ඔවුන් කිසියම් සුවිශේෂී කාර්යයක දී තමන් සමග තරගකාරීව කටයුතු කරතැයි සලකන පුද්ගලයන් කෙරෙහි වඩාත් ආක්‍රමණශීලි ආකාරයෙන් කටයුතු කළ හැකිය (Carver & Glass 1978). ඔවුන් හෘද රෝගවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ද පෙන්නුම් කරයි. එසේම මෙවැනි පුද්ගලයන් ආතතියට පත් වූ අවස්ථාවල අන්‍යයන්

සමඟ එක්ව වැඩ කිරීමට වඩා තනිව වැඩ කිරීමට වැඩි කැමැත්තක් දක්වයි (Dembroski & MacDougall 1978).

**ලිංගිකත්වය**

ස්ත්‍රීන් හා පුරුෂයන් ආක්‍රමණශීලි චර්යාව ප්‍රකට කරන ආකාරයෙහි වෙනසක් දැකිය හැකිය (Encyclopedia of Psychology 2000). බොහෝ පර්යේෂණ මගින් පෙන්වා දී ඇති ආකාරයට සංස්කෘතික, සමාජ හා ආර්ථික භේදයකින් තොරව පුරුෂයන් ස්ත්‍රීන්ට සාපේක්ෂව වඩාත් ආක්‍රමණශීලි ලක්ෂණ ප්‍රකට කරයි. කෙසේ නමුත් මෙම වෙනස්කම්වල ප්‍රමාණය ආක්‍රමණශීලි චර්යාවේ ස්වභාවය හා සන්දර්භය අනුව වෙනස් වේ. පුරුෂයන් ස්ත්‍රීන්ට වඩා කායිකව ප්‍රචණ්ඩකාරි වේ. නමුත් පුරුෂයන් කායිකව ප්‍රචණ්ඩකාරි වන අවස්ථාවල ස්ත්‍රීන් ද ඒ හා සමානව වාචිකව ප්‍රචණ්ඩත්වය මුදා හරියි (Hogg & Vaughan 2018). ඇමරිකාවේ අපරාධවලට අත්අඩංගුවට පත්වන පුද්ගලයන්ගෙන් 99% ක්ම පුරුෂයන් වේ. ඒ ඒ අපරාධ වර්ගය අනුව ගතහොත් මනුෂ්‍ය ඝාතනවලින් 80% ක් සිදුකර ඇත්තේ පුරුෂයන් විසිනි. සොරකම්වලින් 92% ක් පමණ පුරුෂයන් විසින් සිදු කර ඇත. බරපතළ ගණයේ පහරදීම්වලින් 87% ක්ම සිදුකර ඇත්තේ පුරුෂයන් ය. එසේ ම පුරුෂයන් ප්‍රචණ්ඩත්වයේ ගොදුරක් බවට පත්වීමේ ඉහළ ඉඩකඩක් ද පවතී. නිදසුනක් ලෙස කාන්තාවක් තවත් කාන්තාවක් ඝාතනය කිරීම සඳහා පෙළඹෙනවාට වඩා විසි ගුණයකින් පුරුෂයෙක් තවත් පුරුෂයෙක් ඝාතනය කිරීමට පෙළඹේ (Gilovich et el 2018).

**ආක්‍රමණශීලිත්වය ඇතිකරන ඉඟි**

ශබ්දාර්ථ මතකයේ තිබෙන ආක්‍රමණශීලිත්වයට සම්බන්ධ ඕනෑම වස්තුවක් හෝ සිදුවීමක් මගින් ආක්‍රමණශීලි සිතිවිලි, ආවේදන හා චර්යාවන් සඳහා ඉඟි ලබා දීමක් හෝ අවශ්‍ය තොරතුරු සපයා දීමක් සිදු කළ හැකිය. ගිනි අවිය ආක්‍රමණශීලිත්වය හා බැඳුණු උපකරණයකි. එබැවින් ගිනි අවියක් දැකීම ආක්‍රමණශීලි සිතිවිලි ඇති කිරීමට හෝ තීව්‍ර වීමට බලපායි. ආක්‍රමණශීලි හැසිරීම් සඳහා ආයුධවල බලපෑම පිළිබඳව මුලින්ම පර්යේෂණ සිදු කළේ ලෙනාඩ් බර්කෝවිට්ස් හා (Leonard Berkowitz) ඇන්තනී ලීපෙජ් (Anthony

Lepage) විසිනි. ඔවුන්ගේ පර්යේෂණ වාර්තාවන්ට අනුව ගිනි අවියක් පෙන්වන ලද පුද්ගලයන් ඇවිස්සූ පසු වඩාත් ආක්‍රමණශීලි ව හැසිරී ඇත. එහෙත් ගිනි අවියක් නොපෙන්වන ලද පුද්ගලයන් ඇවිස්සූ පසු එවැනි ආක්‍රමණශීලිත්වයක් දැකගත නොහැකි විය. මෙකී බලපෑම විද්‍යාගාර පර්යේෂණවල දී මෙන්ම ක්ෂේත්‍ර පර්යේෂණවල දී ද තහවුරු කර ඇත (Encyclopedia of Psychology 2000).

**සමාලෝචනය**

ආක්‍රමණශීලි චර්යා එක් අංශයකින් මිනිසාගේ පැවැත්ම සඳහා ඉවහල් වන අතර අනෙක් අංශයෙන් එය මිනිසාගේ විනාශය සඳහා ද හේතු වේ. ආක්‍රමණශීලිත්වය පිළිබඳ සහජ න්‍යාය (පරිණාමවාදී න්‍යාය) මඟින් පෙන්වා දෙන ආකාරයට ආක්‍රමණශීලිත්වය මිනිසාගේ සහජ ආරක්ෂණ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වේ. පරිණාමීය අවදියේ විලෝපිකයන්ගෙන් ආරක්ෂා වීම උදෙසාත් කණ්ඩායමේ ගැහැණු සත්වයන් දිනා ගැනීමෙන් ප්‍රජනන කාර්යය සිදු කිරීම සඳහාත් ආක්‍රමණශීලිත්වය බෙහෙවින් ඉවහල් විය. එහෙත් මිනිසා තමන්ගේම වර්ගයාට එල්ල කරන ආක්‍රමණශීලිත්වය නිසා පරිණාමීය යුගයේ සිට අද දක්වාම විශාල මිනිසුන් ප්‍රමාණයක් ඝාතනයට ලක් ව ඇත.

ආක්‍රමණශීලිත්වය තුළ නිසැක වශයෙන් ම ජීවවිද්‍යාත්මක යාන්ත්‍රණයක් තිබුණ ද එය තේරුම් ගැනීමට හා විස්තර කිරීමට ජීවවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳව පමණක් අවධානය යොමු කිරීම ප්‍රමාණවත් නැත. මන්ද ආක්‍රමණශීලීත්වය පැනනගින්නේ පුද්ගලයා හා පරිසරය අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වීම නිසාවෙනි. පුද්ගලයාට සමාජ සන්දර්භය තුළ තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකි වන විට හෝ පාරිසරික සංසිද්ධීන් තමාගේ පාලනයෙන් ගිලිහෙන විට පත්වන ඉච්ඡාභංගත්වයට ප්‍රතිචාරයක් වශයෙන් ආක්‍රමණශීලිත්වය පැනනැගිය හැකිය. ඇතැම් මනෝවිද්‍යාඥයන්ට අනුව ආක්‍රමණශීලිත්වය ඉගෙනුම් චර්යාවකි. ආක්‍රමණශීලි චර්යා එනම් පහරදීම, බැනවැදීම හා තර්ජනය කිරීම වැනි චර්යා සිදු කරන ආකාරය ඉගෙන ගනු ලැබුව ද ඊට අදාළ අවස්ථාමය සාධකවලින් තොරව ආක්‍රමණශීලිත්වය පැන නැගිය නොහැකි ය. ළමුන්ගේ

බොහෝ ආක්‍රමණශීලි චර්යා ඉගෙනුම් චර්යාවන් වේ. ඊට හේතුව ඔවුන් ජීවවිද්‍යාත්මක මානසික හා සමාජීය පරිණත භාවයට පත් ව නොතිබීම යි. ඒ අනුව මිනිසාගේ ඇතැම් ආක්‍රමණශීලි චර්යා ඉගෙනුම් න්‍යාය මඟින් විස්තර කළ හැකි වුව ද සියලු ආක්‍රමණශීලි චර්යා එමඟින් විස්තර කිරීම ගැටලු සහගත බව පෙනීයයි. ආක්‍රමණශීලිත්වය සඳහා ස්ත්‍රී-පුරුෂ භාවය, ප්‍රජානනික අගතීන්, ආකල්ප හා විශ්වාස, පෞරුෂ ලක්ෂණ ආදි පුද්ගලබද්ධ සාධක බලපානු ලැබුව ද ආක්‍රමණශීලිත්වයේ සෑම පැතිකඩක්ම එම සාධක මත පදනම් ව විස්තර කළ නොහැකි ය. කෙසේ නමුත් ආක්‍රමණශීලි චර්යා පිළිබඳව මෙකී සමාජ මනෝවිද්‍යාත්මක ප්‍රවේශ එම චර්යා වර්ධනය වන ආකාරය විස්තර කිරීමට හා ඒවායෙහි ස්වභාවය අවබෝධ කර ගැනීමට බෙහෙවින් ඉවහල් වී ඇති බව පෙනේ.

## මූලාශ්‍රය


Archer, J. (1991). The influence of testosterone on human aggression. British Journal of Psychology, 82, 1–28.

Averill, J. R. (1983). Studies on anger and aggression: Implications for theories of emotion. American Psychologist, 38, 1145–1160.

Baron, R.A. and Branscombe, N.R. (2017). Social Psychology (14th ed). Pearson Education Limited. Malaysia.

Carver, C. S., & Glass, D. C. (1978). Coronary-prone behavior pattern and interpersonal aggression. Journal of Personality and Social Psychology, 36, 361–366.

Cicek, I.E,. et al (2017). Digit ratio (2D:4D), impulsiveness and aggression in male heroin addicts: A prospective controlled study. Personality and Individual Differences. (117), 1-5.

Dehue, F., Bolman, C., & Vollink, T. (2008). Cyberbulling: Youngsters' experiences and parental perception. Cyberpsychology & Behavior, 11, 217–223

Dembroski, T. M., & MacDougall, J. M. (1978). Stress effects on affiliation preferences among subjects possessing the Type A coronary-prone behavior pattern. Journal of Personality and Social Psychology, 36, 23–33.

Dollard, J., Doob, L., Miller, N., Mowrer, O. H., & Sears, R. R. (1939). Frustration and aggression. CT. Yale University Press, New Haven.

Forgas J.P., Kruglanski A.W and Williams K.B. (2011). The Psychology of Social Conflict and Aggression. Taylor and Francis Group: New York.

Gilovich, T., Keltner, D., & Nisbett, R. E. (2011). Social psychology. New York, W.W. Norton & Co.

Hogg, M. and Vaughan, G. (2018). Social Psychology (8TH Ed). Pearson Education Limited: United Kingdom.

Kazdin, A. E. (2000). Encyclopedia of psychology. Washington, D.C., American Psychological Association.

Klinesmith, J., Kasser, T., & McAndrew, F. T. (2006). Guns, testosterone, and aggression. Psychological Science, 17(7), 568–571.

Krahé B. (2013). The Social Psychology of Aggression. Psychology Press: London and New York.

Matthews, K. A. (1982). Psychological perspectives on the type-A behavior pattern. Psychological Bulletin, 91, 293–323.

Mazur, A., & Booth, A. (1998). Testosterone and dominance in men. Behavioral and Brain Sciences, 21, 353–363

Moore, D. A., & Swift, S. A. (2011). The three faces of overconfidence in organizations. In D. De Cremer, R. van Dick, & J. K. Murnighan (Eds.), Social psychology and organizations. Routledge/Taylor & Francis, New York.

Myers, D.G. and Twenge, J.M. (2013). Social Psychology (12th ed). McGraw-Hill Education: New York.

Myerscough, R. and Taylor, S. (1985). The Effects of Marijuana on Human Physical Aggression. Journal of Personality and Social Psychology. 6 (49), 1541-1546.

Patterson, G. R., Littman, R. A., & Bricker, W. (1967). Assertive behavior in children: A step toward a theory of aggression. Monographs of the Society of Research in Child Development (Serial No. 113), 32, 5.

Solnick, S. J., & Hemenway, D. (2012). The 'Twinkie Defense': The relationship between carbonated non-diet soft drinks and violence perpetration among Boston high school students. Injury Prevention, 18, 259–263.

Stanton, S. J., Beehner, J. C., Saini, E. K., Kuhn, C. M., & LaBar, K. S. (2009). Dominance, politics, and physiology: Voters' testosterone changes on the night of the 2008 United States Presidential election. PLoS One, 4(10), e7543.

VandenBos, G.R. (2015). APA Dictionary of Psychology. American Psychological Association: Washington, DC.